# නව සන්ධානයක අවශ්‍යතාව

ඒකාබද්ධ යාන්ත්‍රණය හෙවත් සුනාමි සහන මණ්ඩලය හෙවත් සුසාන මණ්ඩලය සම්බන්ධයෙන් පසුගිය දා ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුවෙන් පැහැදිලි වූයේ ගිවිසුමේ ඇතැම් වගන්තිවලින් මෙරට ස්වෛරීභාවයට තර්ජනයක් වන බව ය. විශේෂයෙන් ම, කලාපීය කමිටුවේ මුදල් පරිහරණය සම්බන්ධයෙන් දී ඇති අතුරු වාරණ නියෝගයෙන් පැහැදිලිවන්නේ ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිබඳ අවබෝධතා ගිවිසුම කෙටුම්පත් කළවුනට කලාපීය කමිටුව මෙරට භාණ්ඩාගාරයට හා විශේෂයෙන් ම පාර්ලිමේන්තුවට වගනොකියන ආයතනයක් බවට පත්කිරීමට තිබූ අවශ්‍යතාව ය.

ශ්‍රේෂ්ඨාධිකරණ අතුරු වාරණ නියෝගය මෙරට දේශප්‍රේමීන්ගේ ජයග්‍රහණයක් වුව ද, එය අතුරු නියෝගයක් පමණක් බව අමතක නොකළ යුතු ය. ජනතා විමුක්ති පෙරමුණ පවරා ඇති නඩුව සම්බන්ධ අවසන් තීන්දුව දෙනු ඇත්තේ පසුවට ය. අතුරු වාරණ නියෝගය නිසා ඒකාබද්ධ යාන්ත්‍රණයෙහි තටු ගැලවී ඇත. එහෙත් ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිබඳව ආණ්ඩුව යැයි කියාගන්නා ආයතනය හා කොටි සංවිධානය අතර ඇතිකරගන්නා ලද ඊනියා අවබෝධතා ගිවිසුම ලියැවිල්ලක් ලෙස පවතී. ඒ ලියැවිල්ල පදනම් වන්නේ රනිල් වික්‍රමසිංහ මහතා හා ප්‍රභාකරන් අතර කලකට පෙර ඇතිකරගන්නා ලද අනෙක් අවබෝධතා ගිවිසුම යැයි කියන සටන් විරාම ගිවිසුම ලෙස ද හැඳින්වෙන තවත් ලියැවිල්ලක් මත ය.

ඊනියා සටන් විරාම ගිවිසුමෙන් සිද්ධ වූයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට සටන් විරාමයක් පැනවීම පමණ ය. කොටි රිසිසේ මිනී මරති. ඔවුහු බුද්ධි අංශය විනාශකිරීමට කටයුතු කරති. බුද්ධි අංශයේ භටයකු මරාදමනු ලැබූ විට ඊනියා ආණ්ඩුවට කළ හැක්කේ ශෝකප්‍රකාශයක් නිකුත්කිරීම පමණකි. ලංඩනයේ බෝම්බ පිපිරවූ විට බ්‍රිතාන්‍ය ශෝකප්‍රකාශයක් පමණක් නිකුත්කර බලා නොසිටියේ ය. ත්‍රස්තවාදීන් අල්ලා ඔවුන්ට නිසා දඬුවම් දීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව සූදානම් වෙයි.

ඊනියා ආණ්ඩුව යනුවෙන් මෙහි සඳහන්කෙරෙන්නේ මේ ආයතනය තමන්ට ව්‍යවස්ථාවෙන් පැවරී ඇති කාර්ය නොකරන බැවින් ය. රටේ ස්වෛරීභාවය රැකීම ආණ්ඩුවක ප්‍රධාන ම කටයුත්ත වුව ද මෙරට ආණ්ඩු යැයි කියාගන්නා ආයතන විසින් නොකෙරෙන දෙය ද එයම ය. මේ ඊනියා අණ්ඩු විසින් කෙරෙන්නේ කොටින්ට හා ඔවුන් පිටුපස සිටින බටහිර ක්‍රිස්තියානි රාජ්‍යවලට ඊළමක් ප්‍රකාශකිරීමට අවශ්‍ය ලිපිලේඛන සපයා දීම ය. අප කලින් සඳහන්කර ඇති අන්දමට කොටි සංවිධානය හා බටහිරයන් එක් පැත්තකින් අද කරන්නේ අනාගතයේ දී බටහිර ක්‍රිස්තියානි නීතිය ඉදිරියේ පිළිගැන්වීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන සම්පාදනය කරගැනීම ය.

සුසාන මණ්ඩලය ප්‍රායෝගික වශයෙන් ගත්කල අනවශ්‍ය බව බටහිරයෝ ද කොටි ද දනිති. ඊනියා ආණ්ඩුව ජනතාව ඉදිරියේ මොන මුසා දෙඩුව ද, සුනාමියෙන් පීඩා විඳි ජනතාවට උපකාර කිරීමට ඒකාබද්ධ යාන්ත්‍රණය වැනි සංකීර්ණ ආයතනයක් අවශ්‍ය නො වෙයි. මුළු රටට ම බලපාන ජාතික මණ්ඩලයක් උතුරු හා නැගෙනහිර පළාත්වල ග්‍රාම සේවක කොට්ඨාශ හතළිස් ගණනක සුනාමි ආධාර බෙදීම සඳහා අවශ්‍ය ඇයි? එහි සිංහල නියෝජනත්වයක් නැත්තේ ඇයි? අද ඒ මණ්ඩලය සඳහා ආණ්ඩුව වෙනුවෙන් ඇමතිවරයකු වූ ඩිව් ගුණසේකර මහතා පත්කෙරී ඇත. ඒ මහතා ඒ තනතුරට පත්කෙරී ඇත්තේ අමාත්‍යාංශ ලේකම්වරයකු විසින් ය. මේ ඊනියා ආණ්ඩුවේ තතු එබඳු ය. අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ඇමතිවරු තනතුරුවලට පත්කෙරෙති. වැඩිකල් නොගොස් මේ ඇමතිවරයා කොටි නියෝජිතයකු සභාපති ලෙස පිළිගනිමින් වැඩකරනු ඇත. බ්‍රිතාන්‍යයේ හෝ ඇමරිකන් එක්සත් ජනපදයේ හෝ ඇමතිවරු හෝ එවැනි තනතුරු දරන්නෝ එලෙස නිවට ආකාරයකට වැඩකරත් ද? ලජ්ජා නැතිකම මහමුදලිකමට වඩා ලොකු යැයි කියමනක් වෙයි. දැන් මහමුදලිලා නැත. දැන් ඇත්තේ ජනාධිපතිවරු හා ඇමතිවරු ය. එබැවින් ඒ කියමන ලජ්ජා නැතිකම ඇමතිකමට ද වඩා ලොකු යැයි කාලානුරූපව සංශෝධනය කළ යුතු වෙයි.

ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිබඳ බටහිර රටවල් ක්‍රියාකෙළේ ද අමුතු ම ආකාරයකට ය. මේ යාන්ත්‍රණ ගිවිසුම පිළිබඳ හොඳ අවබෝධයක් රාජ්‍ය නොවන ගැත්තකු වූ කුමාර් රූපසිංහට කලකට පෙර සිට ම තිබුණි. ඔහු එකල අනෙක් අයට අයට අභියෝගාත්මක ව කතාකෙලේ ඔවුන් ගිවිසුමට විරුද්ධවන්නේ එය දැකීමෙන් පසුව දැයි අසමින් ය. ඔහු

© Prof. Nalin De Silva

එකල ද එහි අඩංගු දේ ගැන කතා කෙළේ ය. කුමාර රූපසිංහ වැනි බටහිරයන්ගෙන් නඩත්තුවන්නකුට ගිවිසුම ගැන දැනගත හැකි විණි නම් බටහිරයන් එහි අඩංගු තොරතුරු නොදැන සිටියේ යැයි කීමට නො හැකි ය. කලාපීය කමිටුවේ මුදල් පරිහරණය පිළිබඳවත් එහි සංයුතිය අනුව කොටි සංවිධානයේ සාමාජිකයකු එහි සභාපති වන බවත් ඔවුන් දැන සිටියා නිසැක ය. එහෙත් ඔවුහු ඒ පිළිබඳ විරුද්ධත්වය ප්‍රකාශ නොකළහ.

ගිවිසුම අත්සන්කරන තුරු නිසොල්මනේ සිටි බටහිරයෝ ගිවිසුම අත්සන්කිරීමෙන් පසුව බයිලා කීමට පටන්ගත්හ. ඇමරිකන් එක්සත් ජනපද ආණ්ඩු ප්‍රකාශ කෙළේ කොටි සංවිධානය තම රටේ ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම්කර තහනම්කර ඇති බැවින් ඔවුන්ට කොටි සාමාජිකයකු සභාපතිත්වය දරණ මණ්ඩලයකට මුදල් ආධාර දිය නොහැකි බව ය. අනෙක් බටහිර රටවල් ද ජපානය ද ඇමරිකන් එක්සත් ජනපදය අනුගමනය කෙළේ ය.ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව අනුව ද ගිවිසුමේ මුදල් පරිහරණයට අදාළ වගන්ති සංශෝධනය කළ යුතු වෙයි. යම්කිසි ආකාරයකින් ඊනියා ආණ්ඩුව කොටි සංවිධානයේ එකඟත්වය, එනම් බටහිර රටවල ද එකඟත්වය, ඇතිව ඒ වගන්ති සංශෝධනය කර වෙනත් ගිවිසුමක් අත්සන් කළහොත් බටහිර රටවලට කිසිම පැකිළීමක් නැතිව කොටින්ට ආධාරකිරීමට හැකිවනු ඇත. එසේ නැතිව වුවද වක්‍ර මාර්ගවලින් ඔවුන් ආධාරකරනු ඇත.

මෙරට දෙමළ ජාතිවාදී ප්‍රශ්නයේ මුල, මැද හා අග ඇත්තේ බටහිර ක්‍රිස්තියානි රාජ්‍ය ය. ඔවුන්ට අවශ්‍ය ඊනියා දෙමළ රාජ්‍යයක් නොව ඉන්දියාව සමීපයෙහි ක්‍රිස්තියානි රාජ්‍යයකි. අද ඉන්දියාව මොන තරම් දේශීයත්වයක් ගැන කතාකළ ද සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වෙමින් පවතියි. එහි සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වූ විශාල මධ්‍යම පන්තියක් වෙයි. පසුගිය දා අගමැති මන් මෝහන් සිං සමග ඇමරිකානු ප්‍රධාන වෙළෙඳ ජාලය වූ වෝල්මාට් සමාගම සමග ගිවිසුමක් අත්සන් කෙළේ ය. බටහිරයන් ක්‍රියාකරන්නේ සැලැස්මකට අනුව බවත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රධාන අරමුණක් නම් මුළු ලෝකයම ආගමින් බැරිනම් සංස්කෘතියෙන් ක්‍රිස්තියානි කිරීම බව අමතක නොකළ යුතු ය.

සුනාමි හෙවත් සුසාන මණ්ඩල සුනාමි ආධාර බෙදීම සම්බන්ධයෙන් ප්‍රායෝගික වැදගත්කමක් නොමැති බව බටහිරයන් නොදැන සිටියා නො වෙයි. ඔවුන් දෙමළ ජාතිවාදීන්ට ආධාරකිරීමේ දී විවිධ රාජ්‍ය නොවන සංවිධාන යොදාගන්නා බව ද රහසක් නො වෙයි. ඔවුන්ට යාන්ත්‍රණ ගිවිසුම මගින් අවශ්‍ය වූයේ ඊළම යුක්තියුක්තකිරීම සඳහා තවත් ලියවිල්ලක් ලබාගැනීම පමණ ය. ඒ ලියැවිල්ල දැන් කොටි මෙන් ම බටහිරයන් ද සතුව ඇත. කොටින්ට ද සුසාන මණ්ඩලය ප්‍රායෝගික ව අවශ්‍ය නො වේ. ඒ අවශ්‍ය වන්නේ ලැජ්ජා නැති ඇමතිවරුන්ට ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව යම් ජයග්‍රහණයක් වුව ද අපට විසඳාගැනීමට ඇත්තේ නෛතික ප්‍රශ්නයකට වඩා දේශපාලන ප්‍රශ්නයක් බව අමතක නොකළ යුතු ය. සුනාමි ලියැවිල්ල හෙවත් ඊනියා ඒකාබද්ධ යාන්ත්‍රණ අවබෝධතා ගිවිසුම දේශපාලන වශයෙන් පරාජය කළ යුතුව ඇත. ඒ කළ හැක්කේ කෙසේ ද? එහි දී නිසැකව ම ජාතික බලවේග ඒකරාශි විය යුතු ව ඇත. අද ඇත්තේ ජාතික බලවේග හා විජාතික බලවේග අතර සටනකි. පුස් කෑ මාක්ස්වාදී පොතපත පරිහරණය කරන්නෝ නිසැකව ම විජාතික බලවේගවල කඳවුරේ වෙති. මාක්ස්වාදයට අවසාන වශයෙන් අවශ්‍ය වන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යෑමට ය. මාක්ස්වාදීහු ද මුළු ලෝකයට ම යුරෝපීය සංස්කෘතිය දීමට උත්සාහ ගනිති. ඔවුහු යුදෙව් ක්‍රිස්තියානි චින්තනයක් මත නොව යුරෝපය පැත්තෙන් බැලූවිට පසුගාමී චින්තනයක් වූ යුදෙව් කතෝලික චින්තනය මත පදනම් වෙති.

ජාතික බලවේග ජයග්‍රහණය කරා මෙයෙහවීමට නව සන්ධානයක් අවශ්‍ය වෙයි. අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මහජන පක්ෂය විසින් ඩැහැගනු ලැබ ඇත. මහජන පක්ෂය යනු ශ්‍රී ල නි පක්ෂයට විරුද්ධව විජය කුමාරතුංග මහතා ඔහුගේ බිරිඳගේ ද සහාය ඇතිව පිහිටුවා ගත් සිංහල බෞද්ධ විරොධී පක්ෂයකි. අද කළ යුතු එක් කරුණක් වනුයේ ශ්‍රී ල නි පක්ෂය මේ පක්ෂ විරෝධීන්ගෙන් ගලවා ගැනීම ය. ඒ සඳහා ශ්‍රී ල නි පක්ෂයෙන් පිටත සිටින ජාතික මතවාදීන් ද ආධාර කළ යුතු වෙයි. මහජන පක්ෂය නමැති පිළිලය ගලවා දමා දේශපාලන වශයෙන් මහජන පාක්ෂිකයන් අකර්මණ්‍යකර ජාතික බලවේගවල දේශපාලන සන්ධානයක් පිහිටුවා ගැනීම අද දවසේ ප්‍රධාන අවශ්‍යතාව වෙයි.

© Prof. Nalin De Silva